1st Place Winner
National Productivity
Award 2020

ISO 9001
SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My Ref.: CSS/03/06/ANN.TR/2025(72) | ඔබේ අංකය / உமது இல / Your Ref.: | දිනය / திகதி / Date: 2025.08.02

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>වාර්ෂික ස්ථාන මාරු - 2025</u>**

දකුණු පළාත් සභාවේ සංවර්ධන නිලධාරී සේවය / කළමනාකරණ සේවා නිලධාරී සේවය / පළාත් රියදුරු සේවය / කාර්යාල සේවක සේවය යන සේවාවන්හි නිරත නිලධාරීන්ගේ 2025 වාර්ෂික ස්ථාන මාරු සඳහා මා විසින් නිකුත් කරන ලද 2025.02.05 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2025 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, උක්ත සේවාවන්හි නිරත නිලධාරීන් සම්බන්ධයෙන් 2025 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ප්‍රධාන ලේකම් මාරු මණ්ඩලයේ නිර්දේශ මත සකස් කරන ලද මාරු මණ්ඩල තීරණ ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියට මුදා හැර ඇති අතර එම මාරු මණ්ඩල තීරණ ලැයිස්තුවෙහි නම් සඳහන් නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් **<u>2025.09.15 දින සිට</u>** ක්‍රියාත්මක කරන ලෙස මෙයින් නියෝග කරමි. තව ද, වෙනත් කරුණු යටතේ ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය විශේෂයෙන් සඳහන් කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු අදාළ දිනයේදී ක්‍රියාත්මක කරන ලෙස ද වැඩිදුරටත් නියෝග කරමි. (දිගුව : https://www.cs.sp.gov.lk/css/csw/transfer_si.html)

| ඇමුණුම | සේවය |
|---|---|
| I | සංවර්ධන නිලධාරී සේවය |
| II | කළමනාකරණ සේවා නිලධාරී සේවය |
| III | පළාත් රියදුරු සේවය |
| IV | කාර්යාල සේවක සේවය |
| V | අභියාචනා ඉදිරිපත් කිරීමේ උපදෙස් මාලාව |

03. එසේම, 2025.02.05 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2025 හි ඡේද අංක 18 හි දක්වා ඇති පරිදි ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දින වන විට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියන්ගේ ස්ථාන මාරුවීම් ප්‍රසූත නිවාඩු අවසන්ව සේවයට වාර්තා කර සති 02කට පසු ක්‍රියාත්මක කළ යුතුය.

04. තවද, මෙම ස්ථාන මාරුවීම් නියෝග පිළිබඳව අදාළ නිලධාරීන්ට කල් ඇතිව දැනුම් දී නියමිත දිනයේදී නව සේවා ස්ථානයෙහි රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව ද දන්වමි.

අ.පි.බ.

05. එමෙන්ම, ස්ථාන මාරුවීම් ලබා ඇති කිසිදු නිලධාරියෙකු නියමිත දිනයෙන් පසුව නිදහස් නොකොට රඳවා ගත නොහැකි අතර, නියමිත දිනයෙදී නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අදාළ නිලධාරීන් නිදහස් කිරීම ඔබගේ වගකීම වන බව ද අවධාරණය කරමි.

06. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් කිසියම් නිලධාරියෙකු අභියාචනා ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම්, අංක 01/2025 හා 2025.02.05 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛයේ ආකෘති අංක 03 ප්‍රකාරව අභියාචනා අයදුම්පත්‍රය මාර්ගගත ක්‍රමවේදය (online) ඔස්සේ නිසි පරිදි සම්පූර්ණ කර, අදාළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව **<u>2025.08.15 දින ප.ව. 11.59 හෝ ඊට පෙර ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවිය ඔස්සේ (www.cs.sp.gov.lk) ස්ථාන මාරු පද්ධතිය මඟින් පමණක්</u>** මා වෙත ඉදිරිපත් කළ යුතුය.

07. නියමිත දිනට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලය විසින් සලකා බැලීමට කටයුතු නොකරන බව අවධාරණය කරන අතර අභියාචනා ඉදිරිපත් කළ යුතු ක්‍රමවේදය සම්බන්ධ උපදෙස් මාලාව (ඇමුණුම 05) මේ සමඟ ඉදිරිපත් කර ඇත.

08. තවද, මා විසින් නිකුත් කරන ලද 2025.02.05 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2025 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ ප්‍රධාන ලේකම් නිල වෙබ් අඩවියට (www.cs.sp.gov.lk) මුදා හැර ඇති බැවින්, එම තීරණවල දෘඪ පිටපත් කිසිදු ආයතනයකට යොමු නොකරන අතර ඔබ යටතේ පවතින සියලුම ආයතනවල සේවය කරන අදාළ නිලධාරීන් වෙත 2025 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**සුමිත් අලහකෝන්**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත්:-

01. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,ජාතික විගණන උප කාර්යාලය - දැ.ගැ.ස.
02. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන), ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත - දැ.ගැ.ස.